**අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය**
**காணாமல் போன ஆட்கள் பற்றிய அலுவலகம்**
**OFFICE ON MISSING PERSONS**

---

**මාධ්‍ය නිවේදනය** **2018 ඔක්තෝබර් මස 08**

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය, බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ හා කළුතර යන දිස්ත්‍රික් තුනෙහි අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන් සමඟ 2018 ඔක්තෝබර් මස 16 වන අඟහරුවාදා රැස්වීමක් පැවැත්වීමට සැලසුම් කර ඇත. ජනතාව සමඟ කරන මෙම සංවාද වැඩ පිළිවෙල මන්නාරම, මාතර, මුලතිවු, ත්‍රිකුණාමලය, යාපනය සහ කිලිනොච්චි යන දිස්ත්‍රික් මුල් කර ගනිමින් මැයි මාසයේ දී දියත් කරන ලදී. මෙම සංවාදය ඉදිරි සති කිහිපය තුළදී දිවයිනේ සෙසු දිස්ත්‍රික්කවලද පැවැත්වීමට නියමිතය.

අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පනත යටතේ හඳුනාගෙන ඇති අතුරුදහන් වූවන් සහ අතුරුදහන් කරවූවන්ගේ ඉරණම හෝ අවස්ථානුගත කරුණු පිළිබඳ සොයා ගැනීම සහ එම තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය 2018 පෙබරවාරි මාසයේදී ස්ථාපිත කරන ලදී.

මින් පෙර පැවති ජන හමුවලදී අතුරුදහන් වූ තැනැත්තන්ගේ පවුල්වල සාමාජිකයන්, අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කටයුතු කරන සිවිල් සමාජ සංවිධාන සහ ක්‍රියාකාරින් ද, මාධ්‍ය වේදීන් ද ඉදිරි සැලසුම් සහ ක්‍රමවේදයන් පිළිබඳව අදහස් ඉදිරිපත් කරන ලදී. එම රැස්වීම්වලදී අතුරුදහන් වූ තැනැත්තන්ගේ කාර්යාලය සහ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ජනතා අදහස් විමසූ අතර ඔවුන්ගේ යෝජනා ලබාගැනීමට ද අවස්ථාවක් ලැබිණි.

2018 ඔක්තොබර් 16 වන දින රැස්වීම කොළඹ 7, හෝර්ටන් පෙදෙසේ අංක 24 දරන ස්ථානයේ පිහිටි අන්තර්ජාතික සම්බන්ධතා සහ ක්‍රමෝපාය අධ්‍යයන පිළිබඳ ලක්ෂ්මන් කදිරගාමර් මධ්‍යස්ථානයේදී පස්වරු 3.30ට පැවැත්වෙනු ඇත.